**ශීර්ෂ 315 - උතුරු පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2020 වර්ෂය**

---

1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

1.1 දැක්ම

උතුරේ ජනතාවගේ අපේක්ෂාවන් තෘප්තිමත් කිරීම උදෙසා යහපාලනය ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීම මගින් ධරණීය සංවර්ධනය සහිතව සමෘද්ධිමත් බව ලඟාකර ගැනීමට අරමුණු කර ගැනීම.

1.2 මෙහෙවර

යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීමත් සමග සේවා හා පහසුකම් නැවත සක්‍රීය කිරීම මගින් ජීවනෝපාය ගොඩනැගීම සහ උතුරේ ජනතාවගේ මානව සම්පත් ධාරිතාවන් සංවර්ධනය කිරීම ඉලක්ක කර ගැනීම.

1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සමගාමී ලැයිස්තුවේ සහ පළාත් සභා ලැයිස්තුවේ දක්වා ඇත.

2. මුළු ප්‍රතිපාදනය හා වියදම

උතුරු පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 29,242.52ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 28,710.72ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 531.80ක් හෙවත් සියයට 1.82ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2020 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 26,942.00 | 26,628.26 | 313.74 | 1.16 |
| මූලධන | 2,300.52 | 2,082.46 | 218.06 | 9.48 |
| එකතුව | 29,242.52 | 28,710.72 | 531.80 | 1.82 |

3. විගණන නිරීක්ෂණය

ඉහත ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා දුන් ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදුකර තිබුණි. පළාත් සභා අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.